[ගරු අනුර දිසානායක මහතා]

වූයේ, මෙම වෙන්දේසියට පෙර දිනයේ, එනම් පෙබරවාරි 26වැනි දින අමාත්‍යවරුන් ද, මහ බැංකුව ද සම්බන්ධ වූ රැස්වීමකදී හදිසි මුදල් අවශ්‍යතාවක් හඳුනා ගත් බවයි. ඒකත් අපි දන්නවා. පෙබරවාරි 26වැනි දා අමාත්‍යවරුන්ගේ විවිධ සාකච්ඡාවක් තිබිලා දැනට කෙරෙමින් තිබෙන ව්‍යාපෘති වෙනුවෙන් කොපමණ මුදලක් ඕනෑද කියලා යම් ඇගයීමකට ඇවිල්ලා තිබෙනවා. ඒක අපිට පිළිගන්න පුළුවන්. රජයක් හැටියට තමන්ට කොච්චර මුදලක් අවශ්‍ය වෙනවාද කියලා අදාළ අමාත්‍යවරුන් කැඳවලා සාකච්ඡාවක් කරන එක වරදක් නැහැ. පෙබරවාරි මාසයේ 26වැනි දා එහෙම සාකච්ඡාවක් කළා. මෙම නිවේදනයේ සෘජුව ප්‍රකාශ නොවූවද හඟවා තිබුණේ එසේ හඳුනා ගත් හදිසි මූල්‍ය අවශ්‍යතාවට අනුව මහ බැංකු අධිපතිවරයා විසින් රුපියල් බිලියන එකක් වෙනුවට රුපියල් බිලියන 10ක් -මිලියන 10,000ක්- දක්වා බැඳුම්කර නිකුත් කළ බවයි. පෙබරවාරි මාසයේ 26වැනි දා සාකච්ඡාවේදී ඇති වුණු ප්‍රතිඵලයක් හැටියට මේක අර්ථකථනය කරන්න උත්සාහ ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙබරවාරි මාසයේ 25වැනි දා ඉදිරිපත් කරලා 27 වැනිදා දවස් දෙකෙන් ගන්න පුළුවන් නම්, වෙන්දේසියේ තියන්න පුළුවන් නම් පෙබරවාරි මාසයේ 26වැනි දා සාකච්ඡාවට කිසිසේත්ම අර ඉදිරිපත් කර තිබූ මිලියන දහස, මිලියන දසදහස දක්වා වැඩි කළ යුතු නැහැ.

එහෙම නම් එකක් කරන්න තිබුණා. ඒ, රුපියල් මිලියන 10000ක වෙන්දේසිය cancel කිරීමයි. එහෙම නැතිනම් තිබුණා ඒ මිලියන 1,000 එසේම තිබියදී අලුත් මිලියන 9,000කට කැඳවන්න. නමුත් එහෙම කරන්නේ නැතිව ඉදිරිපත් කරන ලද මිලියන 1,000 මිලියන 10,000 දක්වා වැඩි කළේ ඇයි? ඒ අනුව මේක ඉතාමත් සැක කටයුතු ගනුදෙනුවක් බව පැහැදිලියි. මෙය පූර්වයෙන් ප්‍රකාශ කරන ලද මිලියන 1,000 බැඳුම්කර නිකුතුව පසුදා මිලියන 10,000ක් දක්වා ඉහළ දැමීම සාධාරණීකරණය කර ගැනීමට දක්වන ලද අසාර්ථක හේතු දැක්වීමක්. මන්ද, එවැනි මූල්‍ය අවශ්‍යතාවක් එදින හඳුනා ගත්තේ නම්, ආසන්න පසු දිනෙක නැවත වරක් බැඳුම්කර නිකුත් කරන්න පුළුවන්. මේකට වැඩි කාලයක් යන්නේ නැහැ. මේකට මාස ගණන් යන්නේ නැහැ. මේක දින දෙකක් ඇතුළත නැවත නිකුත් කරන්න පුළුවන්.

හදිසි අවශ්‍යතාවක් හඳුනා ගත්තා නම්, ඒ හදිසි අවශ්‍යතාවට අවශ්‍ය වන මුදල් ප්‍රමාණයට ඉතා ඉක්මනින් නැවත බැඳුම්කර නිකුත් කරන්න පුළුවන්. තමුන්නාන්සේලා ඊට පස්සේ බැඳුම්කරයක් නිකුත් කළා. රුපියල් බිලියන 30ක බැඳුම්කරයක් නැවත නිකුත් කළා. එහෙම ඉතා ඉක්මනින් කෙටි කාලයක් ඇතුළතදී මුදල් සොයා ගන්න පුළුවන්. කෙටි කාලයක් ඇතුළත මුදල් සොයා ගැනීමේ ක්‍රමයක් හැටියටම තමයි මෙය තිබෙන්නේ. එහෙත් එසේ නොකර පෙබරවාරි මාසයේ 27 වැනි දිනට නියමිත බැඳුම්කර නිකුතුවේ වටිනාකම ඉහළ දැමීම පිටුපස වෙනත් අරමුණක් ක්‍රියාත්මක වූ බවට සාධාරණ සැකයක් මතු වෙනවා. මෙය කිසිසේත්ම යටපත් කරන්න හෝ පැහැදිලි කරලා වසා දැමිය හැකි ගනුදෙනුවක් නොවෙයි. ඒ වාගේම මහ බැංකු අධිපතිවරයාට ඥාතීත්ව බැඳීමක් සහිත Perpetual Treasuries Limited නම් ආයතනයක් මඟින්, -මේක තමයි ප්‍රශ්නය. වෙන කවුරුවත් නොවෙයි, මහ බැංකු අධිපතිවරයාගේ බෑණනුවන්ගේ මූලිකත්වයෙන් තිබෙන සමාගමක් මේක - ඉදිරිපත් කරන ලද පොලී අනුපාතිකය ලංසු පිළිගැනීම වෙනුවෙන් මෙම බැඳුම්කර අගයන් ඉහළ දැමූ බවට චෝදනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ජය වේවා!

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ අදාළ පුද්ගලයා මීට පෙර ආණ්ඩුවේ නිල් බලකායට මුදල් එක් රැස් කර ගැනීම වෙනුවෙන් කටයුතු කළ පුද්ගලයා. ඒකටත් ජය වේවා කියන්න.

මේ බැඳුම්කර නිකුතුව මිලියන 1,000 සිට 10,000 දක්වා වැඩි කළේ, නිශ්චිත ලෙස තෝරා ගන්නා ලද, හඳුනා ගන්නා ලද මහ බැංකු අධිපතිවරයාගේ ඥාතීත්වයක් තිබෙන සමාගම ඉලක්ක කොට ගෙනයි. මෙම තත්ත්වය පෙර පැවැති රාජපක්ෂ ආණ්ඩුවේ දූෂිත මූල්‍ය ගනුදෙනුවලම තවත් දිගුවක්. ඒ විධියටම යන දිගුවක් බවට මේ කාරණය පත් වෙලා තිබෙනවා. රාජපක්ෂ පාලනය පෙරළා දැමීම සඳහා ඡන්දය ප්‍රකාශ කළ අතිබහුතරයක් වූ ජනතාව මෙවැනි තත්ත්වයක් කිසි සේත්ම අපේක්ෂා කළේ නැහැ. ඉතා කෙටි කාලයක් ඇතුළත මෙවැනි තත්ත්වයක්, මෙවැනි ගනුදෙනුවක් මේ රටවත්, මූල්‍ය සමාගම්කරුවන්වත්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන කිසිවකුවත් අපේක්ෂා කළේ නැහැ. ඒ පාලනය බිඳ වැටීම සඳහා මැදිහත් වුණු ජනතාව තුළ මෙවැනි යටිකූටවූ ගනුදෙනු පිළිබඳව කිසිම අභිලාෂයක් තිබුණේ නැහැ. නමුත් පරණ පාරේම නැවත ගමන් කරන දිගුවක් බවට තමයි මේ ගනුදෙනුව පත් වෙලා තිබෙන්නේ. ඉස්සරවෙලා මේවාට සම්බන්ධ වුණේ ඇමෙරිකානු පුරවැසියෝ; දැන් සිංගප්පූරු පුරවැසියෝ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකයි සිද්ධ වෙලා තිබෙන්නේ.

මෙම තත්ත්වය තුළ මහ බැංකුවේ බැඳුම්කර වෙන්දේසිය ආශ්‍රිතව පැන නැඟී ඇති පහත ගැටලුවලට අදාළ අමාත්‍යවරයා පිළිතුරු ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වනවා. ඒ වාගේම මේ ගැන සොයා බැලීම සඳහා පිහිටුවා තිබෙන පරීක්ෂණ කමිටුව කිසි සේත්ම අපි පිළිගන්නේ නැහැ. නීතිඥවරුන් තුන් දෙනෙකු දමලා පරීක්ෂණ කමිටුවක් හදන්නේ කොහොමද? ඒ නීතිඥවරුන්ගේ වතගොත මම කියන්න යන්නේ නැහැ. ඒ නීතිඥ මහත්වරු කවුරුන්ද කියන එක මටත් වඩා හොඳින් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු දන්නවා ඇති. මෙවැනි ගනුදෙනුවක් පරීක්ෂා කිරීමට හෝ විමර්ශනය කිරීමට හෝ ඔවුන්ට තිබෙන හැකියාව, ඔවුන්ට තිබෙන නිපුණතාව, ඔවුන්ට තිබෙන අත්දැකීම් මොනවාද? ඔබතුමන්ලා දන්නවා කවුරුන්ද ඒ නීතිඥවරු කියලා. ඒ සමහර අය ඔබතුමන්ලාගේ නාම යෝජනා පත්‍රයට අත්සන් කරපු නීතිඥවරු. ඒ ගොල්ලෝ තමයි දමන්නේ මේ පරීක්ෂණයට. මේ ගැන ගමේ කථා වෙනවා, "හරියට හොරාගේ අම්මාගෙන් ජේන අහනවා වාගේ" කියලා. මෙවැනි තත්ත්වයක් තමයි නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒ නිසා ඉතා ස්වාධීන පරීක්ෂණ කණ්ඩායමක් මේ සඳහා පත් කළ යුතුයි. මෙම ගනුදෙනුව පිළිබඳව විශේෂයෙන්ම මූල්‍ය ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන සැකය, සංකාව, විරෝධය සමනය කරන්න දැන් පත් කොට තිබෙන මේ පරීක්ෂණ කණ්ඩායම පිළිබඳව කිසි සේත්ම සෑහීමකට පත් වෙන්නේ නැහැ කියන එක තමයි අපගේ අදහස. ඒ අනුව මම මෙම ප්‍රශ්නවලට පිළිතුරු අපේක්ෂා කරනවා.

1. 2015 පෙබරවාරි 27වැනි දින බැඳුම්කර නිකුතුවේ වටිනාකම දස ගුණයකින් ඉහළ දැමීමට හේතුව කුමක්ද?

2. හදිසි මුදල් අවශ්‍යතාවක් වෙනුවෙන් වෙනත් වෙන්දේසියක් අදාළ කොන්දේසි පූර්වයෙන් ප්‍රකාශ කර නැවත කැඳවීමට පියවර නොගත්තේ ඇයි?

   මුදල් අවශ්‍ය නම් පූර්ව කොන්දේසි සහිතව ඉතා ඉක්මනින් නැවත වෙන්දේසියක් කැඳවන්න තිබුණා.

3. මිලියන 1,000ක් වැනි මුදලක් කල්පිරීම් සඳහා අවුරුදු 30ක කාලයක් ලබා දුන්නේ කුමන හේතුවක් මතද? ඒ වෙනුවෙන් සියයට 12.5ක ඉහළ පොලී අනුපාතයක් ප්‍රකාශයට පත් කරනු ලැබුවේ ඇයි?

4. පෙබරවාරි 26වැනි දින පැවැති රැස්වීම හා පසු දින බැඳුම්කර නිකුතුවේ අගය ඉහළ දැමීම අතර සම්බන්ධයක් තිබේද?

5. බැඳුම්කර නිකුතුවේ අගය ඉහළ දැමීම නිසා ඉහළ පොලී අනුපාතයක් යටතේ වූ ලංසු පිළිගැනීමට සිදු වූයේද? එසේ නම් එමඟින් මහ බැංකුවට අලාභයක් සිදු වී තිබේද? එසේ නම් ඒ කොපමණද?

6. පෙබරවාරි මස 27 වැනි දින බැඳුම්කර නිකුතුව සඳහා එක් එක් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලංසු ප්‍රමාණය සහ එක් එක් ආයතනයට බැඳුම්කර නිකුත් කරන ලද ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් සභාවට ඉදිරිපත් කරනු ලබන්නේද?

7. මේ ගනුදෙනුව පිළිබඳව පවත්වනු ලබන පරීක්ෂණයක් සාධාරණ හා අපක්ෂපාති වනු පිණිස මහ බැංකුවේ සභාපතිවරයා තාවකාලිකව ඉවත් කරනු ලබන්නේද?

ඔහු ඒ මුල් පුටුවේ තබා ගෙන පරීක්ෂණ කරනවා.

මේක තමයි පසු ගිය කාලයේම වංචා හා දූෂණවලදී කරපු වැඩේ. ඒ අදාළ පුද්ගලයා එතැනම තියාගෙන පරීක්ෂාවට භාජන කරනවා. එම නිසා ඔවුන් අනිවාර්යය නිවාඩු යැවීමක් හෝ තාවකාලික වැඩ තහනම් කිරීමකට ලක් කොට මෙම පරීක්ෂණ සිදු කළ යුතුයි. ඒ පුද්ගලයා ඉවත් කිරීමට මනස හදා ගන්න බැරි නම්, ඉවත් කිරීම සඳහා තීරණයක් ගන්න බැරි නම් අඩුම තරමින් පරීක්ෂණ සාධාරණවීම සඳහා එවැනි ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතුයි. ඒ වාගේම, මෙම ගනුදෙනුව අත්හිටුවා, නතර කිරීමට ඔබතුමන්ලා සූදානම්ද කියන ප්‍රශ්නයත් විමසන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා හට අවස්ථාවක් ලබා දීම පිළිබඳව නැවත ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම නතර වෙනවා.

භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම: ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

திறைசேரி முறிகள் வழங்கல் : மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று

ISSUE OF TREASURY BONDS : STATEMENT BY HON. PRIME MINISTER

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රකිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය ගැන මේ ගරු සභාවේ කරන මේ ප්‍රකාශයෙන් ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නවලටත් පිළිතුරු දෙන්න පුළුවන්.

ඉහළම ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුව, ජනතාවට වැදගත් වන්නා වූ කරුණු පිළිබඳව දැනුවත් විය යුතු බව මම තරයේ විශ්වාස කරනවා. මෙහිදී මූල්‍ය වැදගත්කමක් සහිත කරුණු විශේෂයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවට අනුව, රාජ්‍ය මූල්‍ය පිළිබඳව සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුයි. අන්න ඒ අනුව තමයි මම ක්‍රියා කරලා තිබෙන්නේ. ගිය සුමානයේ මට මේ සම්බන්ධව මාධ්‍ය සාකච්ඡාවක් කැඳවන්නය කිව්වා. නමුත් මම කැඳෙව්වේ නැහැ. මොකද, මේ සභාවේ අදහස් අරගෙන තමයි අපි අන්තිම තීරණය ගත යුත්තේ. නමුත් පසු ගිය කාල වකවානුවේ මෙවැනි කරුණු පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් නොකළ බව මේ සභාවේ සිටින ගරු මන්ත්‍රීවරුන් දන්නවා. එදා අප මතු කළ කිසිදු ප්‍රශ්නයකට නිසි පිළිතුරු ලැබුණේ නැහැ. සිදු වුණු සහ සිදු වෙමින් පවතින අක්‍රමිකතා පිළිබඳව අප මෙම ගරු සභාවේදී කරුණු හෙළිදරව් කළා. නමුත් එවක රජයේ ප්‍රතිචාරය වුණේ, අපට අවමන් සහ අපහාස කිරීම පමණයි. බැඳුම්කර නිකුතුව පිළිබඳව මා කිසිදු ප්‍රසිද්ධ ප්‍රකාශයක් මෙතෙක් නොකළේ පවත්නා ගැටලු පිළිබඳව අඳ, ගොළු, බිහිරි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට නොවෙයි. එම නිසා මාගේ නිහඬත්වය වරදවා වටහා ගන්න එපා. මට අවශ්‍ය වුණේ ඒ පිළිබඳව මාගේ පළමු ප්‍රකාශය මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමටයි.

මේ ගැන තීරණ ගන්නේ මේ ගරු සභාවද, එහෙම නැත්නම් පිටින් දෙන කරුණු අනුවද කියලා අපි තීරණය කරන්න ඕනෑ. මම හිතන හැටියට එය මේ ගරු සභාවට අනුව කරන්න ඕනෑ. එම නිසා මීට කලින් එහෙම නොකළාට, මම ගිය බ්‍රහස්පතින්දා ප්‍රකාශ කළා, අපි මේ ගැන මේ ගරු සභාවේදී ප්‍රකාශයක් කරනවා කියලා. මම ඒ කාරණය විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. අපි මේ ගරු සභාවට වාර්තාව ඉදිරිපත් කළාම, මේ ගරු සභාව තමයි ඒ ගැන වාද කරලා, මගේ අමාත්‍යාංශය මේ ගැන සොයා තිබෙන කරුණු දිහා බලා ඒ අනුව ක්‍රියා කරන්නේ. මම ඒ වාර්තාව අනුව ගත යුතු පියවර ගන්නවා.

කාගේ හරි බලපත්‍රයක් අහෝසි කරන්න ඕනෑ නම් ඒ බලපත්‍රය අහෝසි කරනවා. ඒක මෙතෙක් කල් සිදු වෙලා නැහැ. කවුරු හරි අයුතු ලාභයක් ලබා ගෙන තිබෙනවා නම් ඒ පිළිබඳව වුවමනා විශේෂ බදු එකතු කරන්න කියලා මම මුදල් ඇමතිතුමාට කියලා තිබෙනවා. කවුරු හරි ඉවත් කරන්න ඕනෑ නම්, ඒ අය ඉවත් කරන්නම්. ඉස්සෙල්ලා වාර්තාව අරගෙන බලමු. පළමුවැනි වතාවටයි මේ වාගේ කාරණයක් පිළිබඳව මේ විධියට පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්නේ. අපි ඒ සම්ප්‍රදාය ඇති කරලායි තිබෙන්නේ?

මෙම ගරු සභාවේ ඉන්න තමුන්නාන්සේලාට ඕනෑ නම් ඒ පිළිබඳ විශේෂ කාරක සභාවක් පත් කරන්න, ඒකත් පත් කරන්නම්. මම එක ප්‍රතිපත්තියක් අනුවයි කටයුතු කරන්නේ. මේ සභාව තමයි මූල්‍ය පාලනය ගෙන යන්නේ. ඒ නිසා මේ සභාවේ සාකච්ඡා කරලා තමයි ඒ කටයුතු කරන්න තිබෙන්නේ. Primary Dealersලා කියන විධියට අපට කටයුතු කරන්න බැහැ. ඒක නම් මම කරන්න යන්නේ නැහැ. මම මෙම ගරු සභාවට ආවේ මහජනතාවගේ නියෝජිතයන් කියන එක අහන්නයි.

මුලින්ම සිද්ධියට අදාළ පසුබිම පිළිබඳව මම කරුණු ඉදිරිපත් කරන්නම්.

මහින්ද රාජපක්ෂ පාලන සමයේදී මහා මාර්ග අමාත්‍යාංශය විසින් කිසිදු මුදල් වෙන් කිරීමකින් තොරව රුපියල් බිලියන 100 ඉක්මවන කොන්ත්‍රාත්වලට අත්සන් කර තිබුණා. මේ හා සම්බන්ධයෙන් ගෙවීම් කටයුතු සිදු කිරීමට කඩිනම් අරමුදල් අවශ්‍ය වුණා. මේක එක ප්‍රශ්නයක්. කරපු වැඩ කටයුතුවලටත් ගෙවන්න තිබෙනවා. අත්සන් කරපු, දැනට කරන වැඩවලටත් ගෙවන්න තිබෙනවා. අපි තීරණය කළේ, කරපු වැඩ කටයුතුවලට - ව්‍යාපෘතිවලට- පසුව ගෙවන්න. දැන් කරගෙන යන වැඩවලට ගෙවන්න, ආරම්භ කරන්න තිබෙන වැඩවලට ගෙවන්න. නමුත් ඒ සඳහා මුදල් තිබුණේ නැහැ. බිලියන 100ක් එක වරම ගන්න බැහැ. අන්න ඒ නිසා මුදල් අමාත්‍යවරයා, මහා මාර්ග අමාත්‍යවරයා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, මහ බැංකුවේ අධිපති හා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ඇතුළු නිලධාරීන් පෙබරවාරි 26වැනි දා රැස්වී මේ ගැන සාකච්ඡා කළා. බිලියන 15ක් කඩිනමින් අවශ්‍ය බවට ඒ ගොල්ලන් එදා තීරණය කළා. ඒ වන විටත් රුපියල් බිලියන එකක් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම වෙනුවෙන් මහ බැංකුව

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

දැන්වීම් පළ කර තිබුණා. I insisted on a public auction because private placements have led to corruption and lack of transparency. Previously, parcels of Government Bonds were handed out to selected individuals on a favoured basis through a system of private placement. It took place outside the normal auctions of Government Bonds. These are what the Primary Dealers are saying. You must look at the facts. කරුණු දිහා බලන්න. බිලියනයක් දමලා ඒ වෙනුවට ගන්නවා, බිලියන දහයක්. Private placements were usually as large as ten times bigger than the amount of Government Bonds sold through the auctions. බිලියනයක් දැම්මොත් private placementsලා බිලියන දහයක් ගන්නවා. ඒ දහය දෙන්නේ යාළුවන්ට. This led to an unhealthy link between some of the officers of the Central Bank's Public Debt Department, Primary Dealers and large corporations who benefited from such private placements. This practice only enriched a handful of cronies of the previous Government. මේ මොකක්ද වුණේ? ඉස්සර public auctions තිබුණාම අපි private placementsවලට ආවා. මෙතැන කරගෙන ගියේ. මේක මහ බැංකුවේ ප්‍රතිපත්තිවලට විරුද්ධයි. Records confirm that private placements had become a norm rather than an exception. In just one instance in 2013, Rs. 16 billion worth of 5-year bonds were sold through auction at a yield of 10.9 per cent. Thereafter, Rs. 76 billion worth of the same bonds were sold through private placements at a higher yield of 11.42 per cent. Who stood to benefit from such acts? The answer is obvious. These Primary Dealers, who are giving all these information, forget the tricks that they have been up to. This may be a fight between rogues.

හැම පැත්තේම ඉන්නේ හොරු, වෙන කවුරුවත් නොවෙයි. අපට හොරු කියලා කිව්වාට අපට වඩා ලොකු හොරු එතැන ඉන්නවා. එච්චරයි මට මේ දවස්වල තේරුණේ. අපේ හොර වැඩ එළියට එනවා. අඩු ගණනේ මේ හොර වැඩ එළියට එන්නේවත් නැහැ. At this particular auction, where criticism has been levelled, there were 36 bids from various Primary Dealers amounting to just over Rs. 20 billion. මේ නිසා අපි මිල ගණන් කැඳවූයේ ප්‍රසිද්ධ වෙන්දේසි ක්‍රමවේදය අනුවයි. මෙතැන එක තර්කයක් තිබුණා, ඉතුරු ටික private placementsවලින් ගන්න තිබුණාය කියලා. මම ඒකට එකඟ නැහැ. ගන්න එකක් ප්‍රසිද්ධ වෙන්දේසි ක්‍රමය යටතේ ගන්න.

රුපියල් බිලියන 20කට අධික භාණ්ඩාගාර බිල්පත් සඳහා මිල ගණන් ඉදිරිපත් කර අනතුරුව රුපියල් බිලියන 10ක් දක්වා මිල ගණන් තෝරා ගන්නා ලෙස ඔහු ප්‍රසිද්ධ ණය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයට උපදෙස් දුන්නා. ඒ ටෙන්ඩර් එක දීලා තිබෙනවා. මහ බැංකුවේ අධිපතිවරයා මේකට සම්බන්ධ වුණාය කියලා කරුණු නැහැ. එය සත්‍යයෙන් තොරයි. මම දෙවැනි වතාවටත් කොමිටියට කිව්වා, ආපසු මේ ගැන හොයලා බලන්න කියලා. ඔහු ඒ උපදෙස් ලබා දුන්නේ නියෝජ්‍ය අධිපතිවරුන් දෙදෙනෙකු ඉදිරියේදීයි. මහ බැංකු අධිපතිවරයා ටෙන්ඩර් මණ්ඩලයේ කටයුතුවලට මැදිහත් වූවාය කියන චෝදනාව පදනමෙන් තොරයි. ඒ ගැන යළිත් විභාග කරන්න කියලා මම මේ කොමිටියට කියලා තිබෙනවා. ඉන් පසුව ටෙන්ඩර් මණ්ඩලය ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කළා. ඒ නිර්දේශ කිසිදු වෙනස්කමකින් තොරව මහ බැංකු අධිපතිවරයා අනුමත කළා. There has been no change of it. The monies that were raised were paid to the Treasury to fund the Divisional-level Development Projects, which was the subject of discussion in the House recently. දැනුත් ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා මතු කළේ ඒ ප්‍රශ්නයයි. මේ කටයුත්ත ක්‍රියාත්මක කරලා තිබෙනවාද, නැද්ද කියලා බලන්න මම මේ මාසයේ 20 වැනිදා දිස්ත්‍රික් ලේකම්වරුන් සියලු දෙනාම කැඳවන්න තීරණය කරලා තිබෙනවා. ඒ නිසා මේ කිව්ව කරුණුත්, දිවි නැහුම වැඩසටහන ගැනත් අපි සැලකිල්ලට ගන්නවා. මුදල් හොයලා මේ වැඩ කටයුතු ඉදිරියට ගෙනි යන්න ඕනෑ. මේ වැඩ කටයුතු නවත්වන්න බැහැ. අද ගමේ ආර්ථිකය පවතින්නේ මේ කරුණු මත. තව අවුරුදු දෙක, තුනකින් මේවා මාරු වෙයි; වෙනස් වෙයි. Subsequent to this bond issue, allegations of insider trading were made. The name of the Governor was mentioned in these allegations and aspersions were cast.

ඒ නිසා අවුරුදු 30ක බැඳුම්කර නිකුත් කිරීමේ කරුණු පිළිබඳව සොයා බැලීම සඳහා මම ත්‍රිපුද්ගල කමිටුවක් පෙබරවාරි 27 වැනිදා පත් කළා. එහෙම නැත්නම් මම මේ ගැන හොයන්නේ කොහොමද? Monetary Board එකට කියන්නද, මම විභාග කරන්නද? ඉස්සෙල්ලාම මම සෑහීමකට පත් වෙන්න ඕනෑ, මොකක්ද සිදු වුණේ කියලා. ඒ වාර්තාව මම මේ සභාවට ලබා දෙන්නම්. සභාව මේ ගැන සෑහීමකට පත් වෙන්නේ නැත්නම් මොකක්ද කරන්න ඕනෑ කියලා අපි බලමු. විශේෂ කාරක සභාවකට යනවාද, වෙනත් පියවර ගන්නවාද කියලා බලමු. නමුත් මේ සභාවේ ආධිපත්‍ය පිළි අරගෙන තමයි අපි ඒ කටයුතු ඇති කරන්නේ, ආපසු මෙතැනට එන්න.

පත් කළ ත්‍රිපුද්ගල කමිටුවේ සභාපති ගාමිණී පිටිපන මහතායි. ඔහු නීතිඥ සංගමයේ නීතිඥයකු වශයෙන් අවුරුදු 27ක පළපුරුද්දක් ඇති කෙනෙක්; විදේශීය හවුල්කාරත්වයක් සහිත සමාගම් ගණනාවක පරිපාලනයට සම්බන්ධ වූ කෙනෙක්. ඔහුට නීතිඥයෙකු හැටියට අවුරුදු 27ක පළපුරුද්දක් තිබෙනවා. කවුද, මේ ගැන කියන්නේ? එහි සාමාජික මහේෂ් කලුගම්පිටිය මහතා අපරාධ නීතිය පිළිබඳ නීතිඥවරයෙකු වශයෙන් අවුරුදු 23ක සේවා පළපුරුද්ද සහිත ප්‍රවීණයෙක්. That is more than what you require to be a President's Counsel. President's Counselලා කරන්න ඕනෑ නැහැ, මේ කවුරුවත්.

තුන්වැනි සාමාජික වන්දිමාල් මෙන්ඩිස් මහතා නීතිඥ සංගමයේ නීතිඥවරයෙකු වශයෙන් අවුරුදු 18ක පළපුරුද්දක් ඇති කෙනෙක්. මම කිව්වා, අපට ඕනෑ කියලා, අවුරුදු 15කට වඩා පළපුරුද්ද ඇති අය. එතුමා පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම් කටයුතු සම්බන්ධයෙන් හිටපු මුදල් අමාත්‍ය කේ.එම්. වොක්සි මහතාට සහාය වුණු නීතිඥයෙක්. ඒ කාලයේ තමයි මේ බැඳුම්කර - primary bonds - ගැන රෙගුලාසි හදලා තිබෙන්නේ. තවම ඒවා ක්‍රියාත්මක වෙලා නැහැ. කවුද කියන්නේ, මේ ගොල්ලන් දන්නේ නැහැ කියලා? මේ සෑම පුද්ගලයෙකුම වසර ගණනාවක පළපුරුද්ද සහිත ප්‍රවීණයන් වන අතර, ඔවුන්ගේ විශ්වසනීයත්වය පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන් විමසා බලන්න පුළුවන්. කරුණාකරලා නීතිඥ සංගමයෙන් අහන්න. මේ නීතිඥවරු, එකිනෙකා අතර කුළුපග සම්බන්ධතා නොමැති අය. විශේෂයෙන්ම මේ බැඳුම්කර එක්ක, Primary Dealersලා එක්ක, බැංකු එක්ක, Perpetual Treasuries Limited එක්ක, අර්ජුන් මහේන්ද්‍රන් එක්ක සම්බන්ධකම් නැති අය තෝරන්න ඕනෑ කියලා මම කිව්වා. ඒ අය තෝරලා දමන්න කියලා කිව්වා. අනෙක් එක මේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියලා මම කිව්වා. ඒ නිසා ඒ ගැන බලා ගන්න, නම කැත කර ගන්න එපා, ඇත්ත කියන්න කියලා කිව්වා.

පත් කළ එම අය තම ප්‍රතිපත්ති සුරකින පුද්ගලයන් වශයෙන් ප්‍රකට අයයි. ඒ නිසාම ඔවුන් මහජන පිළිගැනීමට ලක් වූ පුද්ගලයන්. මේ වන විටත් එම කමිටුව රැස්වී පරීක්ෂණ කටයුතු ආරම්භ කර තිබෙනවා.

මේ සඳහා ආර්ථික විශේෂඥයන් ඕනෑ කියලා සමහර අය කියනවා. මම අහන්නේ එක ප්‍රශ්නයයි. නඩු දැම්මොත්, නඩු අහන්නේ කවුද? අපි ආර්ථික විශේෂඥයන් නඩුකාරයන් කරනවාද? පත් කරන්නේ සාමාන්‍ය නීතිඥවරුන්. මේකට අපට නඩු දමන්න බැහැ. නැත්නම් ව්‍යවස්ථාව වෙනස් කරලා විශේෂඥයන් ගෙනෙන්න ඕනෑ. නැත්නම් jury එකට Primary Dealersලා දමන්න ඕනෑ. මතක තියා ගන්න, නඩුවක් දැම්මොත් අන්තිමට ඒ නඩුව අහන්නේ මේ සුදුසුකම් තිබෙන අය මිසක් වෙන කවුරුවත් නොවෙයි. මහාධිකරණයක, දිස්ත්‍රික් අධිකරණයක නඩු අහන්නේ මේ අය. මොකක් හරි විධියකට නීතිය කඩ කරලා තිබෙනවා නම් මේක උසාවියට ඉදිරිපත් කරන්න බැහැ. ඉස්සර වෙලාම ඒ ගැන අහන්නේ මේ නීතීඥයන් තුන් දෙනා. ඉන් පස්සේ කටයුතු කරන්නට මම හැර 224 දෙනෙක් තෝරලා තිබෙනවා. ඒ ඔබතුමන්ලා සියලු දෙනා.

ඔබතුමන්ලා කී දෙනෙක් bond market එක ගැන දන්නවාද? කී දෙනෙක් “Brooke Bond” ගැන දන්නවාද? කී දෙනෙක් “James Bond” ගැන දන්නවාද? ඉතින් එහෙම නම් අපි සුදුසු නැහැ. එහෙම නම් අපි Primary Dealersලා මෙතැනට දමන්න ඕනෑ. ඔබතුමන්ලාට ඕනෑ නම් අපි විශේෂඥ දැනුම ලබා දෙන්නම්. ඔබතුමන්ලා ඒ දැනුම අර ගන්න, අපි ඒකට උදව් කරන්නම්. මට ඕනෑ, Parliamentary Budget Office එකකුත් පටන් ගන්න. ඉතින් මේ මොකක්වත් වහන්න වුවමනා නැහැ. මේකට විශේෂඥයන් ඕනෑ කියලා කියනවා. අන්තිමට අපි නේ අහන්නේ.

ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා අදටත් COPE එකේ වැඩ කටයුතු හොඳට කර ගෙන යනවා. ඒ කමිටුවේ සභාපති වෙන්න ඔබතුමාට තිබුණු විශේෂ දැනුම මොකක්ද? පාර්ලිමේන්තුවේ ඉන්න අපි දන්නවා, කොහොමද මේ වැඩ කටයුතු කරන්න ඕනෑ කියලා. අපි මේවා කරලා තිබෙන නිසා අපට දැනුමක් තිබෙනවා. [බාධා කිරීමක්]

නීතිඥවරුන් බොහෝ දෙනෙක් එක්සත් ජාතික පක්ෂයට වැඩ කළා, පසු ගිය ජනාධිපතිවරණයේදී. ඇත්ත වශයෙන්ම ශිරානි බණ්ඩාරනායක අග්‍ර විනිශ්චයකාරතුමිය ඉවත් කළාට පස්සේ එකතු වුණු අයගෙන් බහුතරයක් හිටියේ නීතිඥවරු. එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති අපේක්ෂක වශයෙන් ඉදිරිපත් වුණාට පස්සේ හෝටලය නීතිඥවරුන්ගෙන් පිරිලා ඉතිරිලා ගියා. මීට ඉස්සෙල්ලා හෝටලයේ මෙහෙම සෙනහක් හිටියේ නැහැ කියලා සඳහන් කරලා තිබුණා. 2,200ක් ඇවිල්ලා හිටියා. අහලා බලන්න. තවමත් එහෙම ඉන්නවා.

මට ඒ අය මාරු කරන්න බැහැ. ඔබතුමන්ලාත් කවුරු හෝ පත් කරන කොට විශ්වාස අය පත් කරන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ අය ඇමතිවරු වෙලා සිටියදීත් ඒ අයට විශ්වාස අය දැම්මේ. මම හොරු දැම්මේ නැහැ, එච්චරයි මම කියන්නේ.

මේ සඳහා ලොකු විවේචනයක් එල්ල වෙනවා. ඒත් නීතිඥ සංගමය එන්නේ නැහැ. ඒකට විරුද්ධව දැන් සිරස ආයතනයත් ව්‍යාපාරයක් ගෙන යනවා. එතැනටත් කෙනෙක් හොයා ගන්නට බැරිව, කවුද ආවේ? ආවේ ශිරාල් ලක්තිලක මැතිතුමා හා සුසිල් කිඳෙල්පිටිය මැතිතුමායි. ශිරාල් ලක්තිලක ගැන මම දන්නවා. එතුමා වැටිලා ඉන්න කොට මම උදව් කළා. එතුමා තනතුරට යන කොට එතැනට යන එකට මම විරුද්ධ වුණේ නැහැ. මම තමයි ඉස්සෙල්ලාම එතුමාව පළාත් සභාවට පත් කළේ. ඒ විතරක් නොවෙයි, රුපියල් මිලියන 5ක් වටිනා පොදු දේපළකට -මගේ නිල රථයට- අලාභ හානි කිරීම සම්බන්ධයෙන් එතුමා මෑත කාලයේ රිමාන්ඩ් බන්ධනාගාරයේත් සිටියා. මම කියන්නේ එච්චරයි. But, I said, "Compound the case, as I do not want to spoil his future or the future of the other lawyers like Maithri Gunaratne, and finish it off". I am not interested in pursuing it or going ahead with it.

මෙම ව්‍යාපාරයට එක්ව සිටින අනිත් කෙනා තමයි සුසිල් කිඳෙල්පිටිය. ඔහු කාන්තාවකට රිවෝල්වරයක් එල්ල කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබා රිමාන්ඩ් භාරයේ සිටි අයෙක්. පසුව එම කාන්තාව විසින් තමන් නැඟූ චෝදනාව ඉවත් කර ගත්තා. [බාධා කිරීමක්] වාඩි වෙන්න, වාඩි වෙන්න. [බාධා කිරීමක්] He is not a lawyer. He was one of our candidates for the 2010 General Elections. - [*Interruption.*] Yes, I know. එවර තමයි ඔහුව ඒ කාරණයට අරගෙන ගියේ. [බාධා කිරීමක්] ඔව්, මම දන්නවා. So, we did not give him nominations and he went with General Sarath Fonseka and later got elected to the Western Provincial Council. I have no problem about that. මම කියන්නේ ඒකයි. This is the one that "Sirasa" has produced.

සිදු කරගෙන යන පරීක්ෂණ මේ බැඳුම්කර නිකුතුවට පමණක් සීමා වෙලා නැහැ. 2012 වර්ෂයේ සිට මේ දක්වා සිදු වූ පොදු වෙන්දේසි කිරීම්, පෞද්ගලික අයදුම්කරුවන්ට බැඳුම්කර නිකුත් කිරීම් ඇතුළු සියලුම ගනුදෙනුත් මීට ඇතුළත්. අවශ්‍ය යැයි හැඟෙනවා නම් මේ පිළිබඳව වෙනත් ප්‍රවීණයන්ගෙන්ද කරුණු විමසීමට කමිටුවට හැකියාවක් තිබෙනවා.’

මීට කලින් මේ ක්‍රියාදාමය සිදු වුණේ අයහපත් ක්‍රමවේදයක් ඔස්සේ නිසා, බොහෝ විශ්මයජනක කරුණු මේ පරීක්ෂණයේදී හෙළිදරවු වෙනැයි මා විශ්වාස කරනවා. මේක බලන කොට මට තේරුණා මීට වඩා ලොකු හොරු ඉන්නවා කියලා. කිසිම භයක් නැතිව කියන්නම් - [බාධා කිරීම්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කම්බා හොරු. කම්බා හොරු.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු අග්‍රාමාත්‍යතුමා කථා කරන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Hon. Deputy Speaker, our behaviour has caused some public esteem for Parliament to come down. But, when I looked at this, - my God! - we are angels compared to these people. - [*Interruption.*]

පසු ගිය සඳුදා සිට අර්ජුන මහේන්ද්‍රන් මහතා නිවාඩු ලබා තිබෙන අතර, මේ පරීක්ෂණ කටයුතු අවසන් වන තෙක් ඔහු තම රාජකාරී කටයුතුවලින් වැළකී සිටින බව ද මට දන්වා තිබෙනවා. මට suspend කරන්න බලයක් නැහැ. එතුමා එන්නේ නැති නිසා එතුමාට එන්න එපා කිව්වා. මේ නිසා සාධාරණ හා අපක්ෂපාතී පරීක්ෂණයක් පැවැත්වීමේ පසුබිම ඔහු සලසා දී තිබෙනවා. මෙම තනතුර මීට පෙර දැරූ පුද්ගලයන් ක්‍රියා කළ ආකාරයට වඩා මෙය හාත්පසින්ම වෙනස් තත්ත්වයක්. කවුරුවත් අයින් වුණේ නැහැ, මීට ඉස්සර. ගෙදර යන්න කිව්වේත් නැහැ. කෙසේ වෙතත්, මහ බැංකු අධිපතිවරයා විසින් අත්සන් කළ යුතුම ලිය කියවිලි වේ නම්, - if there is something that he has to sign - ඒ පිළිබඳ තීරණයක් ගැනීමට කලින් මා නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීමට බලාපොරොත්තු වෙනවා. වෙන කෙනෙකුට අත්සන් කරන්න බැරිද, මෙතුමා අත්සන් කරන්න වුවමනා ද කියලා කථා කරලා අහනවා. That is the high standards we are bringing in here and let us see what the findings are and then, if you want to

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

put this matter to a select committee, certainly go ahead and put it to a select committee. I am not opposed to it.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයට එරෙහිව චෝදනාවක් නැඟුණු අවස්ථාවක, ඒ පිළිබඳ ප්‍රතිචාර දැක්වීමත්, ඒ ගැන සොයා බැලීමට පරීක්ෂණ කමිටුවක් පත් කිරීමත්, එතැනින් නොනැවතී ඒ පිළිබඳව පාර්ලිමේන්තුව හමුවේ ප්‍රකාශයක් කිරීමත් මෑත ඉතිහාසයේ මේ සිදු වන්නේ පළමු වතාවටයි. That is, I am accepting the fact that we are supreme; that the Central Bank is supreme. If you all have other ways of doing, certainly - I have always said this from that side of the House and I am practising it from this side of the House.

පසු ගිය දස වසරක පමණ කාලයක් තුළදී මූල්‍ය ක්ෂේත්‍රයේ සිදු වූ මෙවැනි අක්‍රමිකතා සම්බන්ධ චෝදනාවන් පිළිබඳව සොයා බැලීම සූක්ෂ්ම අයුරින් නවතා දමා තිබුණා. ඒ අවස්ථාවල සමහරු කටයුතු කළේ ඇස්, කන් නැති අය වාගෙයි. ඇත්තෙන්ම සිදු කළ යුත්තේ මේ රජය ගෙන යන යහ පාලන ක්‍රියාදාමය ප්‍රශංසාවට ලක් කිරීමයි. නමුත්, ඒ කාලයේ නොදරුවන් මෙන් කථා නැතිව සිටි අය අද වීරයන් මෙන් රජයට පහර ගසන්න ඉදිරිපත් වී සිටිනවා. ඒකත් පාර්ලිමේන්තු දේශපාලනයේ කොටසක්. විරුද්ධ පක්ෂය පැත්තට ගියාම පහර ගසන්න ඕනෑ; ආණ්ඩුව පැත්තට ගියාම defend කරන්න ඕනෑ.

There are a number of allegations of violations of the Colombo Stock Exchange market rules and the Securities and Exchange Commission regulations. Under the last Government, there were a large number of allegations. The minor ones were compounded and 13 large cases were abandoned purportedly on the lack of evidence. They were not investigated nor settled when it should have been probed further. The Members of the Securities and Exchange Commission was providing power for these people. I would like this to be recorded in the Hansard. I have requested the Securities and Exchange Commission to go into these cases. If necessary, I will bring legislation to permit such inquiry. I am also seeking for the appointment of a Parliamentary Select Committee to inquire into these transactions. මා ඒ පිළිබඳ යෝජනාව දැන් ඉදිරිපත් කර තිබෙනවා. අතීතයේ සිදු වුණේ මොකක්ද, ඒවාත් බලන්න ඕනෑ - and what are the laws necessary to control this market. They played hell out of our economy - ඒ පුද්ගලයෝ අපේ ආර්ථිකය නැති කරලා තිබෙන්නේ. Since some of the issues raised are under consideration by the Committee, I prefer to give an elaborate answer after the report is submitted. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, සමහර ඒවා ගැන තොරතුරු ඔබතුමා ළඟ තිබෙනවා. ඉතුරු ඒවා ගැන මට වාර්තාවක් ලැබෙන්න තිබෙනවා. It is a technical report. මා එය ඔබතුමාට දෙන්නම්. මේ වාර්තාවෙන් පසුව ඇතුළු කරන්න.

එවිට මේ ගරු සභාවේ ඔබ සැමට ඒ පිළිබඳ විමර්ශනය කරන්නට, නිදහසේ අදහස් පළ කරන්නට අවකාශ ලැබෙනවා. අපට මොකුත් හංගන්න වුවමනා නැහැ. ව්‍යාපාරික ප්‍රජාවට යහපත් වන, නිදහස් හා සාධාරණ වාතාවරණයක් අප විසින් නිර්මාණය කර තිබෙනවා. ඔවුන්ට දැන් බියෙන් තැති ගැනීමට අවශ්‍යතාවක් නැහැ. මෙය මෙරට මාධ්‍ය ක්ෂේත්‍රයටත් පොදුයි. තර්ජනය කිරීම, තැති ගැන්වීම් හෝ සුදු වැන්වලින් යන්න ඔවුන්ට අවශ්‍ය වන්නේ නැහැ. පසු ගිය කාලයේ ඔවුන්ට සමහර ක්ෂේත්‍ර ගැන කථා කිරීම තබා ඒ ක්ෂේත්‍ර දිහා බලන්නවත් බැරි විධියට තහංචි දමා තිබුණා.

Now, I would like to cite some of these instances. Take the case of Nimal Perera. There were large numbers of surveillance referrals made to the Colombo Stock Exchange. Nevertheless, you allowed him to head the Pan Asia Bank. - [*Interruption.*] He is not fit and proper. That is what I have to go into. You put two ex-Central Bank employees to head two commercial banks - Ranee Jayamaha and Dheerasekara - thereby having it under the control of the Rajapaksa regime. You put ex-employees, with an additional retirement pension like in Avant Guard. Avant Guard එකට විතරක් නොවෙයි, මෙතැනටත් දමලා pension එක ගත්තා. ඊට පසුව ඒ අය ලවා පාලනය කළා.

The National Savings Bank purchased 13 per cent of the Finance Company shares at Rs. 50 per share. That is Rs. 20 above the market value. The masterminds behind this were Ajith Devasurendra and Dinal Wijemanne. Today, the Finance Company has recorded accumulated net losses of Rs. 16 billion. This is what I want to stop.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Still, the case is pushed down.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Whatever it is, we have to take action. We can even bring laws or appoint a Select Committee. Let us go into this and stop it once and for all. We do not like it. ගනුදෙනුකරුවන්ගේ රහස්‍යභාව හා සම්බන්ධ සියලුම ආචාර ධර්මවලට එරෙහිව යමින් නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුවේ එවකට සිටි කළමනාකාරිත්වය විසින් හිටපු අග්‍රවිනිශ්චයකාර ශිරානි බණ්ඩාරනායක මහත්මියගේ පෞද්ගලික බැංකු වාර්තා බලහත්කාරයෙන් නිකුත් කළා. බැංකු ක්ෂේත්‍රයේ නියැළී සිටි අය මේ පිළිබඳව සොයා බැලීම වටිනවා. Hon. Eran Wickramaratne, who was asked to retire from the National Development Bank - was it Russell de Mel?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நெடுஞ்சாலைகள், உயர்கல்வி மற்றும் முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Highways, Higher Education and Investment Promotion)
Yes.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඊට පසුව නීතිය පෙන්වූ නිසා රසෙල් ද මෙල් ඉවත් කළා. මේ මිනිසුන් තමයි අද Primary Dealers. They are the biggest dealers. They are the biggest Primary Dealers who are complaining today. මේවා කැසිනෝවත්, සූදු පොළවල්වත් නොවෙයි. මේවාට අදාළ වූ පිළිගත් සම්ප්‍රදායන්, සම්මුතීන් තිබෙනවා. ඒ වාගේම ව්‍යාපාර ක්ෂේත්‍රයේ නියැළී සිටින්නන් පිළිබඳ සොයා බැලීම සිදු විය යුතු යැයි මා සිතනවා.

Take for example Dilith Jayaweera. His roles in the Colombo Land and Development Company and the Reef Comber have to be probed by the authorities. Another example is Scott Newman and Kosala Heengama. Their roles in Environment Resources Investments require very close scrutiny.

Then, I will give you another example, the SriLankan Airlines. The Cabinet approved, by decision 11/1459/545/009 of 4th August 2011, the investment of US Dollars 520 million of equity into SriLankan Airlines and Mihin Lanka over a five-year period. A sum of US Dollars 230 million was required for re-fleeting. The other requirements being the repayment of bank overdrafts/loans - US Dollars 52 million; repayment of outstanding creditors - CPC - US Dollars 28 million and others US Dollars Rs. 15 million; funding of working capital (maintain adequate cash reserves) - US Dollars 94 million; investment in infrastructure/fixed assets - US Dollars 81 million (includes investments required in Mattala and Ratmalana Airports to provide ground handling services); Mihin Lanka: re-fleeting - US Dollars 10 million; funding of working capital (maintain adequate cash reserves) - US Dollars 5.5 million; repayment of previous outstanding creditors - US Dollars 4.5 million. The airline has received a total of US Dollars 375 million from the previous Government. Out of this total, US Dollars 50 million was spent on re-fleeting and the balance was utilized to cover the losses. Only US Dollars 50 million. Just imagine! As a result, SriLankan Airlines does not own a single aircraft. But, we have some air-conditioned buses and some cars.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Shame!

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
You all did not know what happened. This is why I say that Parliament must be given the financial authority.

කැබිනට් මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය එහිදී අනුගමනය කර නොමැති බව ඉතා පැහැදිලියි. ඒ වාගේම එසේ නොකළ බව යළි කැබිනට් මණ්ඩලයට දැනුම් දී නැහැ. මේ මුදල් ඒවා වෙන් කළ කාරණා වෙනුවෙන් යොදවා නැහැ. ඒ නිසා ශ්‍රී ලංකන් ගුවන් සේවයට එක ගුවන් යානයකවත් අයිතිය නැහැ.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු කළ යුතු ගෙවීම් හා ලංකා බැංකුවෙන් ලබා ගත් ණය පියවීම සඳහා මාර්තු 31වැනි දාට පෙර ශ්‍රීලංකන් ගුවන් සමාගමට තවත් ඇමෙරිකානු ඩොලර් මිලියන 125ක් අවශ්‍යයි. ඒ ගැන කරන්න පුළුවන් මොනවාද කියලා බලන්න අද සවස මුදල් ඇමතිතුමායි, මමයි මුණ ගැහෙනවා. ඒ කියන්නේ, ඔබතුමන්ලා දන්න ඩොලර් මිලියන 520ට අමතරව අඩු ගණනේ තව ඩොලර් මිලියන 300ක් සමඟ අපට සම්පූර්ණයෙන් මේ රටට ගෙවන්න තිබෙන ණය මේක නිසා ඩොලර් මිලියන 800කට වඩා වැඩි වෙනවා.

අර්ජුන මහේන්ද්‍රන් මහතාට විරුද්ධව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් පසු ගිය දා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිල්ලක් භාර දී තිබුණා. මමත් විරුද්ධ පක්ෂයේ හිටියා නම් ඔහොම දෙයක් කරනවා. එහෙත් ශ්‍රීලංකන් ගුවන් සමාගම සම්බන්ධයෙන් එසේ කිරීමට ඔබතුමන්ලා සූදානම්ද කියලා මා ඒ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අහන්න කැමැතියි.

රටේ සංවර්ධනය වෙනුවෙන් සැබැවින්ම වියදම් කළ මුදල් ප්‍රමාණය වාගේම දූෂිතයන්ගේ සාක්කු තර වූ ආකාරයත් හෙමින් නමුත් ළඟදීම අපි අනාවරණය කරන බව මම ප්‍රකාශ කරන්නට කැමැතියි. ඒ අය ජනතාවගේ මුදල් නිකරුණේ නාස්ති කළ ආකාරය ළඟදීම මේ රටේ ජනතාවට දැන ගන්නට ලැබේවි. සමෘද්ධිය පිළිබඳ වෙනස් චිත්‍රයක් මවා පෙන්වීමට උත්සාහ කළාට සැබැවින්ම තිබුණේ ඊට ප්‍රතිවිරුද්ධ ඛේදජනක තත්ත්වයක්. විවිධ බොරු ව්‍යාපෘති ඔස්සේ, වර්ධනය හා ලැබීම් පිළිබඳ ව්‍යාජ ප්‍රචාර සමාජගත කර තමන් ආර්ථික විශේෂඥයන් යැයි කියා ගත් පිරිසකගේ පාලනය යටතේ මහ බැංකුව පසු ගිය වසර තුනේදී මහා පරිමාණයෙන් පාඩු ලබා තිබෙනවා. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා කළ එවැනි සංදර්ශන වෙනුවෙන් කැබිනට් අනුමැතියකින් තොරව ඩොලර් මිලියන ගණන් මේ අය පසු ගිය කාලයේ වියදම් කරලා තිබෙනවා. එම සමාගම්වල රියැදුරන්ට පවා ඒ වෙනුවෙන් ඉහළ ගෙවීම් කර තිබෙනවා. ඒ ශ්‍රී ලංකා විදේශ දූත සේවාව දේශපාලන හිතවතුන්ගෙන් හා පැවති රජයේ ඥාතීන්ගෙන් පිරී තිබූ පසුබිමක දියි.

සැබැවින්ම අපේ තානාපති කාර්යාලවලින් සිදු වූයේ රට ප්‍රවර්ධනය කිරීම වෙනුවට ඒවායේ සේවය කළ අය පිම්බීම පමණයි. අතිවිශාල මුදල් ප්‍රමාණයක් නිරපරාදේ නාස්ති වුණා. මහ බැංකුව මේ සියල්ල වංචනික ලෙස මෙහෙය වූ බවටත්, ආර්ථික දත්ත වෙනස් කළ බවටත් විශ්වසනීය චෝදනා මෙතිදී මතු වුණා. එය එක අතකින් රටේ ආර්ථිකයට හානි කිරීමක්. අනෙක් අතින් තම පෞද්ගලික අරමුණු සඳහා බදු ගෙවන ජනතාවගේ මුදල් කොල්ල කෑමක්. මේ වංචනිකයන් නීතිය ඉදිරියට පමුණුවන්න අප කිසිසේත්ම පසුබට වන්නේ නැහැ. මෙතැන වුණු සිද්ධිය ගැන පමණක් නොවෙයි, අතීතයේ සිදු වුණු ඒවා ගැනත් අපි සොයා බලා කටයුතු කරනවා. ඒ හැම එකටම අපි යම්කිසි බද්දක් පනවනවා. අවශ්‍ය නම් ඒ මුදල් ආපසු අය කර ගන්නවා.

As a result of past misdeeds, the Central Bank has now been forced to embark on the task of re-building their credibility and standing as the country's most credible financial institution. This is no easy task, since the spin masters have turned the institution into a wasteland. They left behind a legacy of mismanagement and misrule. They have been adopting a system of private placements of bonds. The criteria they adopted allowed the Central Bank to cut deals with the Primary Dealers.

Rebuilding international confidence and credibility has become an uphill task. Who are the people who are responsible for this mess? We may have half a trillion to a trillion rupees worth of commitments made mainly on highway projects and we will have to cut down on some of them. We just cannot go on. I want to have the whole amount disclosed to the House in time to come because the House must decide as to what has to be done. That is why I want the Parliament to be a Government. These are the problems that we are facing. You will also have ideas. You were in the Government and you saw what was happening from inside. අපි එළියේ ඉඳගෙන දැක්ක ඒවා.

රජය සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ විශ්වාසය බිඳ වැටී ඇති බව සමහර මාධ්‍ය වාර්තා කරනවා. නමුත් සැබැවින්ම සිදුව තිබෙන්නේ පෞද්ගලික අංශය කෙරෙහි ජනතා විශ්වාසය බිඳ වැටී

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

තිබීමයි. මටත් ඒ ගැන තිබෙන්නේ එහෙම අදහසක්. Even I have no confidence in the private sector, these big businesses. I am calling on the Primary Dealers and the big businesses to say that they have to fall in line with what is happening and be ready for a transparent society. නූතන පාරදෘශ්‍ය පද්ධති සමඟ අනුගත වෙනවාද, නොඑසේ නම් ඉන් බැහැර වෙනවාද යන්න තීරණය කිරීමට පෞද්ගලික අංශයට අද කාලය එළඹ තිබෙනවා. මම ළඟදීම ඒ අයව කැඳවනවා. Now, you all must decide. You all have complained about the Central Bank and I appointed a Committee. So, you in the private sector, tell me about all the other people you have been associating with. Do you want me to clean it up or are you going to clean it up? That is what I want to ask.

The Associate Editor of the "Daily Mirror"called on Arjuna Mahendran to resign. But, long ago, Kesara Abeywardena ran an article asking me to resign as the Leader of the UNP. Fortunately, I did not take his advice. So, I cannot be advising anyone to follow Kesara Abeywardena's advice. Mr. Kesara Abeywardena was a lackey of the Rajapaksa regime, who is guilty of covering up blatant attacks on media freedom. Such persons of questionable integrity preaching morals to us is not only reprehensible but also abhorrent. His colleagues are calling on him to "go in the name of God - go". If he resigns, then he can set an example for Arjuna Mahendran to resign.

Has the media not been irresponsible? "The Sunday Leader" owner, Asanga Seneviratne, runs a business that has made losses from the inception. How is it that he has so much money to pour in the business of creating public opinion? Where does that money come from? From where are the funds? These are all those who benefited from the Rajapaksa's. I am sure Members of this House are aware that one electronic media outlet has made me a target. Hardly a day passes without a campaign of misinformation and character assassination; all because I am not prepared to dance to the tune of the owner and meet his demands. I must confess that I am emboldened by what they are doing. It has given me courage and strengthens my resolve to expose their sinister motives. There is also an ugly side to it. Innocent people are being misled but such numbers are dwindling. Their performances have ruined their credibility and lost them the trust of the public.

One reason for this is that Indian Companies are looking for oil and gas in the Palk Strait. They are exploring for natural gas. There is one company with strong media connections that wants to partner with one of these Indian Oil Exploration Companies. However, the only credible partner for Indians in Sri Lanka is the Ceylon Petroleum Corporation. No one else has their expertise. So, I have said that I will not allow collaboration with any other Sri Lankan Company. You go by yourself or come with the Ceylon Petroleum Corporation. Naturally, they must be annoyed with me. This is just money for nothing. Why should I give money for nothing, the money that should come back to the people. I am not prepared to do this. I am for the private sector, but not for this type of private sector. පෞද්ගලික අංශයේ, බැංකු ක්ෂේත්‍රයේ සහ කොටස් වෙළෙඳ පොළේ තිබෙන අක්‍රමිකතා ඉවත් කිරීමට මම කැප වී සිටිනවා. මේ මහජනයාගේ යුගයයි. මම ඇහුම්කන් දෙන්නේ මහජනතාවටයි. මහාරාජාලාට නොවෙයි.

I also want to state that there is an imperative need in Sri Lanka for an Independent Broadcasting Authority. This is like the one existent in the United Kingdom to ensure ethical and fair conduct. Some institutions at present have become tools in the hands of their owners, who have to protect not only their business empires but also, more importantly, their secrets and sinister ambitions.

In fact, I have a letter sent to me by Mr. Arjuna Mahendran of today's date, 17th March, 2015. It states, I quote:

"Television Reports relating to Good Governance

Regarding allegations made by the Sirasa Television Network that I had stated there was a lack of good governance in the recent auction of Treasury bonds, I wish to state that no such comment was ever made by me. This Television Station took a voice cut of my conversation in which I stated that the Central bank advertised the sale of Rs. 1 billion worth of Treasury bonds on 26th February, 2015 because it could not foresee how much could be raised through the same auction. These comments cannot in any way be construed to imply that there was a lack of good governance."

It is only after we assumed office that the Central Bank adopted a more prudent system of calling for competitive bids. As a result, the Government is able to raise funds at the most competitive rates. This would ensure that the Government is able to raise money at the most competitive rates. The way the bond markets behave and how the secondary market works can be complicated and not many would understand the complex nature of the transactions. But, we can compare the latest 30-year bond issued under this Government and the ones that were issued under the previous one. The 30-year bond of June 2014 was issued at an average interest rate of 11.75 per cent. The latest bond was sold at 11.73 per cent, slightly lower than the rate paid last year. This means, we were able to raise just over Rs. 10 billion at a rate cheaper than what the previous Government paid.

Furthermore, there are several previous instances of the Central Bank accepting much higher volumes of bids than what were advertised. On 14th February, 2014, Rs. 1 billion worth of Treasury Bills was offered and over Rs. 11 billion was eventually sold. On 14th November of the same year, Rs. 2 billion was offered and over Rs. 13.5 billion were sold. What our Government and the Central Bank have done is to raise money for the Government at the best possible rates through a competitive bidding process instead of using private placements. But, I also want to see in this instance whether there were any shortcomings, whether there was any fraud, whether there

was insider trading, just to make sure. So, that will be in the report you will get and you can debate that in the House.

The House would agree that it is not a healthy practice to allow private placements when we could get better terms by opening up to a competitive environment. By resorting to a traditional transparent auction of Government Bonds, the Central Bank has already made significant progress in raising funds for the Government. You all say the auction was not transparent. So, that is what we are looking into, to keep the House informed. Just last week, a record of Rs. 100 billion was raised in four auctions to repay Rs. 79 billion of bonds coming due this week and to keep funding Government projects. This is all money that we need for all the issues that the Hon. Shantha Bandara raised after he became the head of the SLFP Youth League. We wish him all the best of luck. The most important aspect of the entire issue is the transparent manner in which we responded to the criticism directed at us from various quarters. We never stifled any voice of criticism.

The media, the civil society, and political parties were given total freedom to voice their opinion on the bond issue. There were no white-vans at the doorsteps of those who criticized the Government on this matter. Secret units did not tap their telephones. No one received threatening telephone calls after voicing their opinion on the bond issue at public forums like they did in the past, under the watch of the Rajapaksa regime. The people, the Legislature, the civil society and the media were either hoodwinked or intimated when it came to problems involving public money. That is the main difference of the present Government. It acts in a responsible manner and is accountable to the public as well as to Parliament. When I raised a question about the Colombo Port City issue in Parliament, the previous Government said that documents of the deal should be brought to Parliament in lorries; not even on a bicycle. That was the manner in which they responded to allegations levelled by the Opposition. If those documents were brought, we could have avoided some of the steps that we are taking today.

Two Directors-General of the Securities and Exchanges Commission - SEC - were forced to resign when they tried to investigate allegations of corruption. Journalists were not even allowed to write about the circumstances under which the Directors-General of the SEC had to leave their positions. We have acted in a totally different manner, demonstrating that we are a Government that is accountable to Parliament.

එම අඳුරු යුගය අවසන් කිරීමට ජනතාවට වුවමනා වෙලා තිබෙනවා. පසු ගිය මාස දෙක පුරාම අපි ඒ "වෙනස" සිදු කරමින් යන බව පෙන්වා තිබෙනවා. අපට දැන් තිබෙන්නේ බැඳුම්කර ප්‍රශ්නයක් නොවෙයි, ජනතාව විසින් ප්‍රතික්ෂේප කළ සමහර පුද්ගලයන් හා සම්බන්ධ ගැටලුවක්. මීට පෙර ඔවුන් ජනාධිපතිවරණයේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාව පැරදවීමට උත්සාහ කළා. දැන් ඔවුන් සහ ඔවුන් වටා ඉන්න කයිවාරුකාරයන් පහත් පෙළේ දේශපාලන වාසි වෙනුවෙන් අපට මඩ ගහන්න උත්සාහ කරනවා.

-මට මඩ ගැහුවාට කමක් නැහැ. මඩ ගහලා, ගහලා, ගහලා දැන් ඉන්නේ. මට මඩ ගැහුවාට කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මඩ ගහන්නේ නැතිකොට තමයි අසනීප වෙන්නේ.-

ජනවාරි 08වෙනි දා පැවැති මැතිවරණයෙන් පසු බලයට පත් වුණු නව රජය විසින් ඇති කළ ප්‍රජාතාන්ත්‍රික වාතාවරණයෙන් ඔවුන් අයුතු ප්‍රයෝජන ගන්න උත්සාහ කරනවා කියන එක මම මේ වෙලාවේදී සඳහන් කරනවා. එදා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පැරදුණා නම් අඩි හයක් පොළොව යටට යවන්නට බලා සිටි අය අද යහ පාලනය ගැන උගන්වන්නට එනවා; සදාචාරය ගැන පාඩම් කියා දෙන්නට එනවා. අපි ඒ අයගේ අරමුණු ගැන හොඳටම දන්නවා. ඔවුන් මේ මඩ ගහන්නේ පරාජයේ වියරුව නිසායි. ඔවුන් ප්‍රශ්න ගැන ක්‍රියා කළ අන්දමට වඩා සහමුලින්ම වෙනස් අන්දමට අපි ප්‍රශ්න ගැන ක්‍රියා කර තිබෙන බව අපි පැහැදිලිව ඔප්පු කොට තිබෙනවා. තැන් තැන්වල හැංගි හැංගි මඩ ගහන්නේ නැතිව මහ මැතිවරණයකට පැමිණ අප සමඟ මුහුණට මුහුණ සටනකට එන ලෙස මම ඔවුන්ට අභියෝග කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහ ජනතාව යහ පාලනය වෙනුවෙන් අපත් සමඟ එකතු වෙලා ඉන්නවා. යුක්තිය හා සාධාරණත්වය, සෞභාග්‍යය හා රැකියා අවස්ථාවන් උදා කිරීම වෙනුවෙන් ඔවුන් අපත් සමඟ සිටිනවා. නිදහස වෙනුවෙන් ඔවුන් අප හා එක් වී ඉන්නවා. අප සියල්ලන් එකතු වී ආරම්භ කළ මේ ගමන ගැන ඔවුන් විශ්වාසය තබා තිබෙනවා. අපි ඒ විශ්වාසය කිසි දා පලුදු කරන්නේ නැහැ. පටන් ගත් මේ අභියෝගාත්මක ගමන අපි සාර්ථක කරනවා. අපි ඒ ගමන ඉදිරියට ගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ඇහුම් කන් දීම ගැන ඔබතුමාටත්, මේ සභාවටත් මම ස්තුතිවන්ත වෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු අග්‍රාමාත්‍යතුමා තමන් වෙත ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය පිළිබඳව විවිධ කාරණා කියලා එය මහ හරින්නට කටයුතු කළා. එතුමා විනාඩි 45ක් තිස්සේ කළ ප්‍රකාශය පිළිබඳව අපට මේ සතියේදීම විවාදයක් අවශ්‍යයි. [බාධා කිරීම්] එතුමා කළ ප්‍රකාශයේ සඳහන් කරුණු සත්‍ය නොවන බව පෙන්වා දීමට, එතුමා කරුණු යටපත් කළ බව පෙන්වා දීමට සහ අර්ජුන මහේන්ද්‍රන් මහතාව ආරක්ෂා කරමින් කටයුතු කිරීම පිළිබඳව පෙන්වා දීමට අපට විවාදයක් අවශ්‍යයි. [බාධා කිරීම්] එම විවාදය මේ සතියේ බ්‍රහස්පතින්දා අපට ලබා දෙන්න. ශ්‍රීලංකන් එයාර් ආයතනය පිළිබඳව සහ Securities and Exchange Commission එක පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒ ඕනෑම දෙයක් පිළිබඳව පරීක්ෂණ පවත්වන්න. එවැනි පරීක්ෂණ පවත්වනවා නම් අපි සතුටු වෙනවා. ඒ පරීක්ෂණ පවත්වන්න. ඒවා තුළින් මේ ප්‍රශ්නය යටපත් කරන්නට එපා.

තමුන්නාන්සේලාගේ කාලයේ සිදු වුණු මේ මහා ප්‍රෝඩාව යටපත් නොකර, සුදුසු පුද්ගලයින් ලවා ඒ පරීක්ෂණ කරන්නය කියා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම මෙතුමා මැතිවරණයක් ගැන කථා කළා. ඕනෑම අවස්ථාවක දී මහ මැතිවරණයකට ඇවිල්ලා එක්සත් ජාතික පක්ෂය පරාජය කිරීමට අපි සූදානම් බවත් මා ප්‍රකාශ කරන්නට කැමැතියි. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා.